ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | නාට්‍ය හා රංගකලාව - I | කාලය පැය 01 යි |
|---|---|---|

උපදෙස් -

- ❖ I පත්‍රයේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ❖ දී ඇති වරණ අතරින් නිවැරදි පිළිතුරට අදාළ වරණය තෝරා X ලකුණ යොදන්න.

---

- ප්‍රශ්න අංක 01 සිට 04 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත සඳහන් ගීත ඛණ්ඩ උපයෝගි කර ගන්න.

A උත්තමවන් ලොව පතලා - එංගලන්ත නමින් යුතු විපුලා
තුංග සිරින් රන්දු සකලා - දේස ලන්ඩන් පුරවර නිමලා

B මම් වගේ පේඩි කතක් මනා
දුටුවාද ලොවේ රුසිරෙන් දිනා
මව්පියො නිදහස් වෙන්නටා
මාව දුන්නයි නාකිවු හමෙකුටා

C අඹ දඹ නාරං කෙසෙල් දෙල්
පනා කකා මේ වනා සැපා ලබනෙම්
ගංගාවේ ඕලු ඇත්තේ ඒවායේ කැම නැත්තෙ
ඇත්තෙ පුෂ්ප අත්තේ අත්තේ ඒවා පිපේ......

D ඉතින් කියන්නේ තුන්වැනි වරට නටන්නේ
පරයයි එන්නේ වටපිට නිතර බලන්නේ
කට දොඩවන්නේ ගිය ගිය තැන පෙරලෙන්නේ
කොක් හඬලන්නේ සොකරිය දෙසයි බලන්නේ

E වනේ ගොසින් අපි නයි අල්ලන්නේ
විනේ යෙදෙයි දවසක දැකගන්නේ
අනේ කවුද මේ ගතුව කියන්නේ
දණේ කාපි මගෙ නයා බොලන්නේ

(01) උඩරට ප්‍රචලිත ගැමි නාටකයට අයත් ගීත ඛණ්ඩයක් ඇතුළත්ව ඇත්තේ,
(1) A වේ (2) C වේ (3 D වේ (4) E වේ

(02) පහතරට ගැමි නාටක විශේෂයට අයත් ගීත ඛණ්ඩය ඇතුළත අක්ෂරය වන්නේ,
(1) A (2) B (3) C (4) D

(03) නාඩගම් සම්ප්‍රදායෙන් නිෂ්පාදිත නාට්‍යයක ඇතුළත් ගීත කොටසක් දැක්වෙන්නේ,
(1) A හිය (2) B හිය (3) C හිය (4) D හිය

(04) නුර්ති ගීතයක කොටසක් ඇතුළත්ව ඇති අක්ෂරය වන්නේ,
(1) A වේ (2) B වේ (3) C වේ (4) E වේ

(05) ප්‍රාසාංගික කලාවක දැකගත හැකි සුවිශේෂී ලක්ෂණය තෝරන්න.

1. රසවින්දනය පුළුල්ව ලැබේ. - සාමූහික නිර්මාණයන්ය.
2. සජීවී කලා නිර්මාණයක් වේ. - ශරීරය පදනම් කරගෙන ඉදිරිපත් කරයි.
3. අනුෂාංගික කලා බහුල වේ - විද්‍යුත් තාක්ෂණික මෙවලම් භාවිතා වේ.
4. ගායනය රංගනය පදනම් වේ - ඕනෑම ස්ථානයක සිට රස විඳීමට හැකිවේ.

(06) වේදිකා නාට්‍ය කලාවේ දැකගත හැකි ලක්ෂණ අනුව වඩාත් ගැලපෙන පිළිතුර තොරතුරු ආශ්‍රයෙන් සොයන්න.

A රස වින්දනය
B සජීවී බව
C සාමූහික බව
D අනුෂාංගික කලා භාවිතය
E සජීවී රංග භූමි නිරූපනය
F සෘජු ප්‍රෙක්ෂක ප්‍රතිචාර

(1) A හා B (2) B හා C (3)E හා F (4) B හා D

- **ප්‍රශ්න අංක 7 සිට 10 දක්වා පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු පාදක කර ගන්න.**

A භරත නාට්‍ය B කලගෙඩි නැටුම C වඩිග පටුන
D ලී කෙලි නැටුම E හංස විල F නිදි කුමරිය
G දෙපානෝ H මානසවිල I අග්නි

(07) නෘත්ත අංගයක් දැක්වෙන පිළිතුර අයත් අක්ෂරය තෝරන්න.
(1) A (2) B (3) C (4) E

(08) නෘත්‍ය අංගයක් ඇතුළත් අක්ෂරය වන්නේ
(1) A (2) B (3B D (4) I

(09) මුද්‍රා නාට්‍යයක් සඳහන් අක්ෂරය තෝරන්න
(1) E (2) F (3) I (4) J

(10) බැලේ නිර්මාණයක් සඳහන් පිළිතුර තෝරන්න.
(1) E (2) G (3) H (4) I

(11) රූපණ ශිල්පියෙකු සතුවිය යුතු ගුණාංගයක් ලෙස සැලකිය හැක්කේ,
(1) නාට්‍ය කලාව පිළිබඳ දැනුම (2) රූපණ හැකියාව
(3) වෙලාවට වැඩ කිරීම (4) නාට්‍ය පෙළ මතක තබා ගැනීම

(12) ප්‍රවීන රූපණ ශිල්පියෙක් ලෙස හැඳින්විය හැකි ශිල්පියා වන්නේ,
(1) විජේරත්න වරකාගොඩ (2) සුගතපාලද සිල්වා
(3) ආර්.ආර්. සමරකෝන් (4) දයානන්ද ගුණවර්ධන

(13) රංග භූමි මූලික වශයෙන් බෙදා දක්වන ප්‍රභේද දෙක වන්නේ,
(1) බිම් මට්ටමේ - බිම්මට්ටමට ඉහළ (2) වෘත්තාකාර
(3) ගෘහස්ථ - එළිමහන් (4) කවාකාර - පින්තූර රාමු

(14) නිශ්චිත රටාවකට,බෙදා වෙන් කළ ක්‍රමයකට අනුව කරනු ලබන චලන හඳුන්වනු ලබන්නේ,
(1) ස්වභාවික චලන නමින් (2) තාලානුකූල චලන නමින්
(2) නිර්මාණාත්මක චලන නමින් (4) රිද්මයානුකූල චලන යනුවෙනි

(15) ක්ෂණිකව ක්‍රියාත්මක වීම, සාමුහික බව , අවකාශය හැකි උපරිමයෙන් භාවිතා කිරීම, අවධානය යනාදි ලක්ෂණ රාශියක් ඇතුළත් රංග ක්‍රීඩාව තෝරන්න.

(1) මෝරා සංග මුහුද
(2) මීයෝ පූසෝ
(3) රාක්ෂයෙක් ගමට ඇවිල්ලා
(4) බල්ලා හා මස් කට්ට

(16) මානසික ඒකාග්‍රතා රංග අභ්‍යාසය මගින් අපේක්ෂා කල නොහැකි අරමුණකි.

(1) ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව
(2) සමාරෝපය පවත්වා ගැනීම
(3) අඛණ්ඩව චරිතයේ රැඳී සිටීමට හැකිවීම
(4) සංවාද භාවාත්මකව ඉදිරිපත් කිරීම

(17) පන්ති කාමරයේ කෙටි කාලයක් තුළ සූදානම් වී දෙනු ලබන මාතෘකාවට හෝ සිදුවීමකට අනුව කරනු ලබන නාට්‍යයක ඇතුළත් නොවන ලක්ෂණය වන්නේ,

(1) නාට්‍යෝචිත අවස්ථා ඇතුළත් වීම
(2) සරල පසුතල,රංග භාණ්ඩ භාවිතය
(2) සුදුසු වේශභූෂනා භාවිතය
(4) හිමිවන සංවාද භාවිතා කිරීම

(18) නාට්‍ය පෙළ රචනයකදී ප්‍රමුඛ වශයෙන් අවධානය යොමු කල යුතු අංගය වන්නේ,

(1) යොදාගන්නා කතා පුවත
(2) තේමාව
(3) නාට්‍යමය අවස්ථා
(4) චරිත

(19) බෞද්ධ සාහිත්‍ය පාදක කර ගනිමින් නිර්මාණය කළ නාට්‍යයක් නොවන්නේ,


(1) මනමේ
(2) සඳ කිඳුරු
(3) සිංහබාහු
(4) වෙස්සන්තර

(20) අනුෂාංගික අංගයක් ලෙස සැලකිය නොහැක්කේ,

(1) නාට්‍ය පිටපත
(2) රංග වින්‍යාංසය
(3) රංගාලෝකය
(4) රංග භූමි අලංකරණය

- **21 සිට 25 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් පින්තූර ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**


ක



ච




ට



ත



ප



(21) පීඩිත පන්තියේ දැවෙන ප්‍රශ්න වේදිකාවට ගෙන ආ කැලණි පාලම,අහසින් වැටුණු මිනිස්සු වැනි නිර්මාණය කළ නාට්‍ය වේදියා දැක්වෙන පින්තූරය වන්නේ,
(1) ක රූපය (2) ට රූපය (3) ත රූපය (4) ප රූපය

(22) කැලණි පාලම, ගජමන් පුවත, වෙස්සන්තර, නාට්‍යවල රංගනයෙන් විශිෂ්ට දක්ෂතා පෙන්වූ ශිල්පියා / ශිල්පිනිය දක්වා ඇත්තේ,
(1) ක රූපය (2) ච රූපය (3) ට රූපය (4) ප රූපය

(23) කුවේණි, හුණුවටයේ කතාව, දිරිය මව හා ඇගේ දරුවෝ නාට්‍ය තුළ විශිෂ්ට රංග ප්‍රතිභාව විදාල වේදිකාව / ටෙලි නාට්‍ය ජයගත් ශිල්පියා/ශිල්පිනිය දැක්වෙන පින්තූරය තෝරන්න,
(1) ච රූපය (2) ට රූපය (3) ත රූපය (4) ප රූපය

(24) වීදි නාට්‍ය කලාව මෙරට ප්‍රචලිත කළ ප්‍රචලිත නාට්‍ය වේදියා /නාට්‍ය වේදනිය දැක්වෙන පින්තූරය වන්නේ,
(1) ච රූපය (2) ක රූපය (3) ට රූපය (4) ප රූපය

(25) වේදිකාව, ගුවන් විදුලිය, ටෙලිනාට්‍ය, චිත්‍රපට ආදි ක්ෂේත්‍ර ගණනාවක රංගන ප්‍රතිභාව ප්‍රකට කළ ජයලත් මනෝරත්නයන්ගේ බොහෝ නාට්‍ය නිර්මාණයන්ට දායකත්වය ලබාදුන් රූපණ ශිල්පියා / ශිල්පිණිය ඇතුළත් පින්තූරය තෝරන්න.
(1) ක රූපය (2) ච රූපය (3) ට රූපය (4) ත රූපය

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**

| ශාන්ති කර්ම | ප්‍රචලිත ප්‍රදේශ | පුද ලබන අදෘශ්‍යමාන බලවේග හා ස්භාවය | අරමුණු | නාට්‍යමය අවස්ථා |
|---|---|---|---|---|
| A ...................... | උඩරට | දේව/යක්ෂ/පොදු | සශ්‍රීකත්වය,රෝග නිවාරණය | යක්කම් පහ |
| දහඅට සන්නිය | B ....... | යක්ෂ/පෞද්ගලික | විවිධ රෝග නිවාරණය සඳහා | සූනියම් යක්ෂණිය තෙවරක් පැමිණීම |
| රට යකුම | පහතරට | C .......................... | දරුවන් නොමැති කාන්තාවන්ට දරුඵල ලබාගැනීම | කපුයක්කාරිය දරු නැලවිල්ල |
| සූනියම් යාගය | පහතරට | යක්ෂ/පෞද්ගලික | D ............................. | වඩිග පටුන |
| ගම්මඩු/දෙවොල්මඩු | සබරගමු | දේව/පොදු | බෝවන රෝගවලින් ආරක්ෂා වීම | E ....................... |

(26) A හිස්තැනට ගැලපෙන ශාන්ති කර්මය විය යුත්තේ,
(1) කොහොඹා කංකාරිය (2) වලියක් මංගල්‍ය
(3) කඩවර කංකාරිය (4) ගරා යකුම

(27) B හිස්තැනට ගැලපෙන පිළිතුර විය යුත්තේ,
(1) උඩරට (2) පහතරට
(3) සබරගමු (4) පොදුවේ ශ්‍රීලංකාවේ

(28) C හිස්තැනට අදාළ අදෘශ්‍යමාන බලවේගය හා ශාන්තිකර්මයේ අරමුණු අනුව ස්වභාවය වන්නේ,
(1) දේව / පොදු (2) ග්‍රහ / පෞද්ගලික
(3) යක්ෂ / පෞද්ගලික (4) යක්ෂ / පොදු

(29) D හිස්තැනට අදාළ අරමුණක් විය හැක්කේ,
(1) අස්වැන්න සරුකර ගැනීම (2) අණවින කෙඩිවින සුවකර ගැනීම
(2) යක්ෂ උවදුරු දුරු කර ගැනීම (4) ගමට රටට සෙත් පැතීම

(30) E හිස්තැනට ගැලපෙන නාට්‍යමය අවස්ථාවක් වන්නේ,
(1) රාම මැරීම (2) ගුරුගේ මාලාව
(3) ගබඩා කොල්ලය (4) දොළහා පෙළපාලිය

- **ප්‍රශ්න අංක 31 සිට 34 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**

| මුල් කෘතිය | රචකයා | පරිවර්තනය/ අනුවර්තන නම | පරිවර්තන ශිල්පියා/අනුවර්තන ශිල්පියා |
|---|---|---|---|
| දි ෂල්වර් සන් | ඇලෙක්සැන්ඩර් වැට් පිලොව් | A........................ | ප්‍රසන්න විතානගේ |
| ඇන්ටිගනී | B............................... | ඇනිටිගනී | ආරියවංශ රණවීර |
| ද ග්ලාස් වෙනාජරී | ටෙනසි විලියමවේ | අහස් මාළිගා | C........................ |
| D ..................... | ගාර්ෂියා ලෝරිතා | මූදු පුත්තු | ගුණසේන ගලප්පත්ති |

(31) A හිස්තැනට අයත්වන පරිවර්තන හෝ අනුවර්තන නාට්‍යයේ නම විය යුත්තේ,
(1) මහ ගෙදර (2) පුත්‍ර සමාගම
(3) පීතෘ (4) ගොඩෝ එනකං

(32) B හිස්තැනට අයත් මුල් නාට්‍ය යේ රචකයා ලෙස සැලකෙන්නේ,
(1) සොෆෝක්ලීස් (2) ප්ලෝටස්
(3) ශ්‍රී හර්ෂ (4) බර්නාඩ් ෂෝ

(33) C හිස්තැනට ගැලපෙන අනුවර්තන / පරිවර්තන ශිල්පියා විය යුත්තේ,
(1) සුගතපාල ද සිල්වා (2) රංජිත් ධර්ම කීර්ති
(3) හෙන්රි ජයසේන (4) බන්දුල ජයවර්ධන

(34) D හිස්තැනට අදාළ වන නාට්‍යයේ මුල් කෘතිය වන්නේ,
(1) ලේඩි ෆ්‍රෝම් ද සී (2) ඉක්නෙව්ටායි
(3) එව්රිටන් (4) යෙර්මා

(35) ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණයක් නොවන්නේ මින් කුමක්ද?
(1) කපුවා කපෝති (2) බෝඩිංකාරයෝ
(3) වහලක් නැති ගෙයක් (4) මෝදර මෝල

- **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට නොගැලපෙන පිළිතුර තෝරන්න.**

(36) කෙටි නාට්‍ය සංකල්පයට අදාළ විශේෂ ලක්ෂණ වන්නේ,
(1) වේදිකා පසුතල,රංගෝපකරණ නිදහසේ භාවිතා කිරීමට කටයුතු කරයි.
(2) කෙටි ඒකාංක නාට්‍ය විශේෂයකි.
(3) සංක්ෂිප්ත මෙන්ම ගැඹුරු අර්ථයකින් යුක්ත වේ.
(4) විශේෂිත සංගීතයක් නොමැත.- චරිත සීමිත වේ.

(37) අභිරූපණ කලාවේ විශේෂයෙන් කැපී පෙනෙන ලක්ෂණ වන්නේ,

(1) අභ්‍යන්තර ශිල්ප ක්‍රම හා බාහිර ශිල්ප ක්‍රම ප්‍රභේද දෙකකි.
(2) පසුතල හා රංග භාණ්ඩ සුළු වශයෙන් භාවිතා කරයි.
(3) විනාඩි 5-10 අතර කාලයක රඟ දක්වයි.
(4) අංග රචනය හා වේෂ භූෂණ එයටම ආවේණික වේ.

(38) සොකරි රංග ශෛලිය තුළ ආවේණික ලක්ෂණය වන්නේ,

(1) අලංකාර ත්‍රිමාන වෙස් මුහුණු පළඳියි.
(2) වංගෙඩිය හා ලන්තෑරුම පසුතලයේ භාවිතා වෙයි.
(3) එකම කතා පුවතක් සිදුවීම් රාශියකින් රඟ දක්වයි.
(4) ගැට බෙරය,දවුල වාද්‍ය භාණ්ඩ ලෙස යොදා ගනියි.

(39) කෝලම් නාට්‍ය තුළ විශේෂයෙන් හඳුනාගත හැකි ලක්ෂණ වන්නේ,

(1) පණිවිඩ කෝළම නම් පූර්ව රංගනයෙන් යුක්ත වේ.
(2) කෝළම් නාට්‍යයක ප්‍රධානියා පොතේ ගුරු වේ.
(3) විනෝදාස්වාදය සමාජයේ චරිත හා සිදුවීම් හාස්‍යයට හා උපහාස්‍යට ලක්කිරීම අරමුණු විය.
(4) සන්නි යකුම කෝලම් නාට්‍යයේ ආරම්භයට බලපා ඇත.

(40) නාඩගම් නාට්‍ය විශේෂය තුළ ඇතුළත් විශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) දකුණු ඉන්දීය කෙරික්කෑත්තු නාට්‍යයේ අභාෂය ලැබීය.
(2) පූර්ව රංගය හා අපර රංගය යනුවෙන් කොටස් දෙකක් වේ.
(3) මද්දලය, කයිතාලම, හොරණෑව වාද්‍ය භාණ්ඩ වේ.
(4) මුදල් අයකර රඟ දැක්වූ පළමු නාට්‍ය විශේෂය වේ.

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | නාට්‍ය හා රංගකලාව - II | කාලය පැය 02 යි |
|---|---|---|

උපදෙස් :-

❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 04 ක් සමඟ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

(01) විකෘති නාට්‍ය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(I) විකෘති නාට්‍යයේ ප්‍රධාන ගැටුමට තේමාව වන අධ්‍යාපනයේ බලපෑම කුමක්ද?

(II) පෙළ නිෂ්පාදනයේදී දැකගත හැකි විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(III) නාට්‍යයේ තේමාව තහවුරු කිරීමට ප්‍රියංගනීට අමතරව එවැනි ඉරණමට ලක්වන චරිත දෙකක් සඳහන් කරන්න.

(IV) ප්‍රියංගනීගේ අධ්‍යාපනය සඳහා හිල්ඩාගේ විද්‍යාත්මක හා අවිද්‍යාත්මක ක්‍රියාකාරකම බැගින් ලියන්න.

(V) නාට්‍ය අවසානයේ ආයාචනාත්මක ගීතයෙන් ඉල්ලා සිටින්නේ කුමක්ද?

(VI) ඔබ දකින විකෘති නාට්‍යයේ සාර්ථක අවස්ථාවක් හා අසාර්ථක අවස්ථාවක් ලියන්න.

*(ලකුණු 02 x 06 = 12)*

(02) නාට්‍ය කලාව සාමූහික කලාවකි. නාට්‍යයක් සාර්ථක කර ගැනීමට උපකාරී වන කලාවන් අනුෂාංගික කලාවන් වේ.

(I) අනුෂාංගික කලාවන් 04 ක් නම් කරන්න. *(ල.02)*

(II) ඔබ නම් කළ කලාවන් කෙටියෙන් පහදන්න. *(ල.04)*

(III) නාට්‍යයක් සාර්ථක වීමට අනුෂාංගික කලා ඉවහල් වන ආකාරය පහදන්න. *(ල.06)*

## <u>II - කොටස</u>

(03) (I) ප්‍රාසාංගික කලාව යන්න හඳුන්වන්න. *(ල.03)*

(II) ප්‍රාසාංගික කලා ප්‍රභේද 04 ක් නම් කරන්න. *(ල.04)*

(III) වේදිකා නාට්‍යයක ඇතුළත් ප්‍රාසාංගික ලක්ෂණ පහදන්න. *(ල.05)*

(04) (I) ප්‍රේක්ෂකයා යනු කවරෙක්ද? *(ල.03)*

(II) ප්‍රේක්ෂකයා සතු කාර්යය කෙටියෙන් පහදන්න. *(ල.03)*

(III) නාට්‍යයකට ප්‍රේක්ෂකයාගේ ඇති සම්බන්ධය පැහැදිලි කරන්න. *(ල.06)*

.

(05) (I) නූර්ති නාට්‍යයේ ආරම්භය හඳුන්වන්න. *(ල.02)*

(II) ප්‍රචලිත නූර්ති නිෂ්පාදකයන් දෙදෙනෙක් නම් කර ඔවුන්ගේ නිර්මාණ දෙක බැගින් ලියන්න. *(ල.04)*

(III) නූර්ති රංග ශෛලියේ විශේෂ ලක්ෂණ පහදන්න. *(ල.06)*

(06) (I) ජයලත් මනෝරත්න මහතා රඟ පෑ නාට්‍යයක් හා ඔහු රඟ පෑ චරිතය නම් කරන්න. *(ල.02)*

(II) ජයලත් මනෝරත්නයන් නිෂ්පාදනය කල නාට්‍ය හතරක් නම් කරන්න. *(ල.04)*

(III) මෙරට නාට්‍ය කලාවට ජයලත් මනෝරත්න මහතාගෙන් සිදුවූ සේවය ඇගයීමට ලක් කරන්න. *(ල.06)*

(07) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන නාට්‍යයෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිත සංඛ්‍යාව ස්ථානීය නාම ආදිය වෙනස් කරගැනීමේ හැකියාව ඇත.

ගමේ පාසලේ දක්ෂ ලෙස ඉගෙනීමෙහි නිරත වූ නිල්නයන වඩාත් හොඳින් ඉගෙනුම සඳහා නගරයේ ජනප්‍රිය පාසලකට 10 ශ්‍රේණියේදී ඇතුළත් වූයේ පසුගිය වර්ෂයේදී ය. ඔහුගේ යහළුවන් සියලු දෙනාටම Smart mobile phones (සුහුරු ජංගම දුරකථන) ඇති බැවින් තමාටද ඉගෙනුම සඳහා Smart mobile phone එකක් ලබා දෙන්නැයි දෙමව්පියන්ගෙන් ඉල්ලයි. මුදල් අගහිඟකම් හේතුවෙන් ලබන වසරේදී සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව ජංගම දුරකථනයක් කෙසේ හෝ මිලට ගෙන ලබා දෙන බව දෙමව්පියන් නිල්නයනට පවසයි. නිල්නයන එකහෙලාම කියන්නේ ඔහුට ඉතා ඉක්මනින් Smart ජංගම දුරකථනය අනිවාර්යයෙන් අවශ්‍ය බවයි.

(I) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සහිත සංවාද රචනා කිරීම සඳහා. *(ල.03)*

(II) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා *(ල.03)*

(III) දෙගිඩියාව, කුතුහලය, උත්ප්‍රාසය සහිත නාට්‍යයෝචිත අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා. *(ල.06)*

**පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)**
**11 ශ්‍රේණිය**
**නාට්‍ය හා රංග කලාව (පිළිතුරු පත්‍රය)**

## 1 පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 1 | **3** | 11 | **3** | 21 | **1** | 31 | **2** |
| 2 | **2** | 12 | **1** | 22 | **3** | 32 | **1** |
| 3 | **1** | 13 | **3** | 23 | **1** | 33 | **3** |
| 4 | **3** | 14 | **2** | 24 | **4** | 34 | **4** |
| 5 | **2** | 15 | **1** | 25 | **4** | 35 | **1** |
| 6 | **3** | 16 | **4** | 26 | **1** | 36 | **1** |
| 7 | **2** | 17 | **3** | 27 | **2** | 37 | **2** |
| 8 | **1** | 18 | **2** | 28 | **3** | 38 | **1** |
| 9 | **4** | 19 | **3** | 29 | **2** | 39 | **2** |
| 10 | **1** | 20 | **1** | 30 | **1** | 40 | **4** |

## II කොටස

(01) (i) තරගකාරී අධ්‍යාපනය නිසා ළමයින්ට ළමා කාලය අහිමිවීම/දරුවන්ගේ හැකියා හා අවශ්‍යතා නොසලකා හැරීම/වැඩිහිටියන්ගේ අවශ්‍යතා සඳහා අධ්‍යාපනය හැදෑරීමට සිදුවීම.
(එක් කරුණක් සඳහන් කරන්න)

(ii) එකම නළු කණ්ඩායම චරිත රාශියක් රංගනය - පුවරු මගින් පසුතල ඇඟවීම./සරල පසුතල හා සරල රංග භාණ්ඩ භාවිතය/ නාට්‍ය ධර්ම හා ලෝකධර්ම ලක්ෂණ අවිත්දයට ඇතුළත් වීම/ ගීත හා නර්තන අවස්ථා තීව්‍ර කිරීමට බහුලව යොදාගැනීම.
(කරුණු කෙක් සෑහේ.)

(iii) ජගත් හා සරණපාල

(iv) විද්‍යාත්මක කාලසටහනක් අනුව පාඩම් කිරීමට අමතර පන්ති සහභාගී කරවීම.
අවිද්‍යාත්මක -බෝධිපූජා- යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් සිදුකිරීම

(v) තරගකාරී නොවන ජීවිතයක් සහිත අනාගතයක් රුචි අරුචිකම් අනුව ඉගෙනුමට හා ජීවත්වීමට නිදහස ඉල්ලා සිටියි.

(vi) සාර්ථක අවස්ථා
- නාටයෝචිත අවස්ථා සහිත වීම.
- චරිත මගින් තේමාව උද්දීපනය වීම.
- සිදුවීම් රාශියක් වේදිකාවට උචිත ලෙස රඟදැක්වීම.
- අනුෂාංගික ලෙස රංගෝචිතව යොදා ගැනීම.
- අපූර්ව තේමාවක් ඇතුළත් වීම.
- ආකර්ෂණ අවස්ථා
- ටියුෂන් පෙළ නාට්‍යයේ ක්‍රියා විකාශනයට බාධාවීම.
- ප්‍රියංගනිගේ සහෝදරිය හා සහෝදර චරිතය නාට්‍යට එතරම් බද්ධ නොවීම.
- වසර හතකට පසුව නාට්‍ය යේ සිදුවීම් ඛණ්ඩනය වීම.
- වෛද්‍යවරියක් වීමෙන් පසුව ප්‍රියංගනී උමතු වීම.

(සාර්ථක හා අසාර්ථක අවස්ථා එක බැගින් පිළිතුරට ප්‍රමාණවත් වේ.)

ප්‍රශ්න 06 ට ලකුණු 2 බැගින් 2 x6 = 12 ක් වේ.

(02) (i) අංග රචනය,වේෂභූෂතා ,රංගභූමි,අලංකරණය ,රංගාලෝකය ,රංගවින්‍යාශය ,රංගභූමි පාලනය
(ලකුණු1/2 x 4 = ලකුණු02)

(ii) ඉහත අනුෂාංගික කලාවන්ගේ ස්වභාවය පැහැදිලි කිරීම සිදුකර තිබිය යුතුය. කෙටියෙන් පැහැදිලි කිරීම ප්‍රමාණවත් වේ. (ලකුණු 04 )

(iii) නාට්‍යයකදී අනුෂාංගික කලා මගින් සිදුවන මෙහෙය හා ඒවායින් නාට්‍යයක් සාර්ථක වීම සිදුවන ආකාරය එක් එක් අනුෂාංගික කලා යටතේ පැහැදිලි කළ යුතුය.
අනුෂාංගික කලා තුනක් යටතේ පැහැදිලි කල විට (ලකුණු 2 x 3 = 06)

(03) (i) ප්‍රාසාංගික කලාවට අදාළ ලක්ෂණ සහිතව පැහැදිලි කල යුතුය. (ලකුණු - 03)

(ii) සංගීත ප්‍රසංග,නර්තන ප්‍රසංග ,වේදිකා නාට්‍ය ,බැලේ,ශපෙරා ,මුද්‍රා නාට්‍ය,ගීත නාටක ආදියෙන් 04 ක් නම් කිරීමට

(ලකුණු - 04)

(iii) සජීවී නළු නිලියන් විසින් ඉදිරිපත් කරන වේදිකා නාට්‍යයක ඇතුළත් ප්‍රාසාංගික ලක්ෂණ ප හක් නම් කර කෙටියෙන් පැහැදිලි කිරීමට (ලකුණු 05)
- සතර අභිනය භාවිතය
- සජීවිව නළුවන් රංගනය කිරීම.
- අනුෂාංගික කලා ප්‍රබලව භාවිතය
- ජීවිත අවබෝධයක් ලබා දීම.
- ගැටුම් අවස්ථා ඇතුළත් වීම.
- ප්‍රේක්ෂක ප්‍රතිචාර එම මොහොතේම ලැබීම.
- වැරදි නිවැරදි කිරීමට නොහැකි වීම.

ඉහත ආකාරයෙන් ලක්ෂණ ලිවිය යුතුය.

(04) (i) නාට්‍යයක් නරඹා එය රස විඳීමේ අරමුණින් ප්‍රේක්ෂකාගාරයේ රැඳි සිටින්නා නාට්‍යයක ප්‍රේක්ෂකයා වේ./නාට්‍යයක් අවධානයෙන් නරඹන්නා රසිකයා, ප්‍රේක්ෂකයා වේ.

(ලකුණු 03)

(ii) නාට්‍ය නරඹන්නෙක්,විචාරකයෙක් හා විනිශ්චයකරුවෙක් ලෙස ප්‍රේක්ෂකයාගේ කාර්යය කෙටියෙන් පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

(ලකුණු 03)

(iii) ප්‍රේක්ෂකයා නාට්‍ය යේ අත්‍යවශ්‍ය අංගයකි.

- ප්‍රේක්ෂකයා නොමැතිව නාට්‍යයක් රඟදැක්විය නොහැකිය.
- සජීවී රංගශිල්පීන්ට ප්‍රේක්ෂකයා ප්‍රබෝධයක් වේ.
- ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍ය යේ සංවර්ධනයට අවශ්‍ය වේ.
- කලාවක් ලෙස වර්ධනය වීමට වැඩි ප්‍රේක්ෂක සහභාගීත්වය අවශ්‍ය වේ.
- ප්‍රේක්ෂක ප්‍රතිචාර අනුව නාට්‍ය කලාවට අවශ්‍ය නවතාවයක් ඇතිකළ හැකිය.
- නාට්‍ය ඉදිරිපත් කරන්නේ ප්‍රේක්ෂකයන්ටය. ඔවුන් වැඩි වැඩියෙන් නාට්‍ය නැරඹීම, නාට්‍ය නිර්මාණ වැඩි වශයෙන් බිහිවීමට බලපායි.

ආදී කරුණු හතරක් ලියා විස්තර කිරීමට ( ලකුණු 06)

(05) (i) වර්ෂ 1887 දී පමණ කොළඹ දී රඟදැක්වුණු උතුරු ඉන්දීය සංචාරක නාට්‍ය කණ්ඩායමක් වූ මොහේන්වර්ජි බලිමාලා නම් ශිල්පියාගේ නායකත්වයෙන් යුත් එල්පින්ස්ටන් ඩ්‍රැමටික් කම්පණි නාට්‍ය කණ්ඩායම රඟ දැක් වූ *ඉන්දුසභා * නාට්‍ය ආභාෂයෙන් නූර්ති නාට්‍ය කලාව ආරම්භ වී ඇති බව දැක්වීම.

(ලකුණු 02)

(ii) සී දොන් බස්තියන් , නීතඥ ජෝන් ද සිල්වා , නීතීඥ චාල්ස් ඩයස් මහත්වරුන්ගෙන් දෙදෙනෙක් නම් කර ඔවුන්ගේ නිර්මාණ දෙක බැගින් නම් කිරීම අවශ්‍ය වේ.

- නූර්ති නාට්‍යකරුවන් දෙදෙනා නම් කිරීමට (ලකුණු 02)
- නූර්ති නාට්‍ය නිර්මාණ දෙක බැගින් නම් කිරීමට (ලකුණු 02 )

(iii) නූර්ති රංග ශෛලීයට අදාළ ලක්ෂණ 04 ක් ලියා පැහැදිලි කිරීමට හෝ කරුණු 06 ක් ලබා දෙන්න.

- රංග කාලය පැය 2 -3 කට සීමා වීම.
- මුල්වරට ස්ක්‍රීන් රංගනයට සහභාගී වීම
- මුදල් අයකර රංගනය කිරීම
- උතුරු ඉන්දීය හින්දුස්ථානි සංගීතය භාවිතය- සංගීත භාණ්ඩ ලෙස- සර්පිනාව,තබ්ලාව,වයලීනය යොදා ගැනීම.
- අලංකාර වේෂභූෂනතා ,විචිත්‍ර වස්ත්‍ර,රංග භාණ්ඩ යොදා ගැනීම.
- ස්භාවික ආකාරයේ සංවාද භාවිතය.
- ගීත හා නර්තනය බහුලව භාවිතය.
- ප්‍රෝසීනියම් රංග භූමිය භාවිතය.
- ජාතික,ආගමික කතා පුවත් බහුලව යොදා ගැනීම.

(06) (i) ජයලත් මනෝරත්න මහතා ඕ්නෑම නාට්‍යක් නම් කර ඒහි ඔහු සතු රංග චරිතය නම් කිරීමට

(ලකුණු 02)

(ii) ජයලත් මනෝරත්න මහතා නිෂ්පාදනය කළ නාට්‍ය නිර්මිාණ

- මහගිරිදඹ
- තලමල පිපිලා
- ගුරු තරුව
- පුත්‍ර සමාගම
- අන්දරේලා
- ලෝකය තනියායක්

එක් නාට්‍යක් නම් කිරිමට (ලකුණු 01 බැගින් 04)

(iii) විවිධ තේමාවන් යටතේ නාට්‍ය නිර්මාණය කිරීම.

- සංකීර්ණ චරිත ආශ්‍රයෙන් සමාජය ලෝකය විවිරණය කිරීම - එසේම ඒ්වා මැනවින් නිරූපණය කිරීම
- සංස්කෘතිය,අර්ථිකය,අධ්‍යාපනය ආදියේ සෝදා පා්‍යව ,කඩා වැටීම,විනාශය කලාත්මකව නාට්‍ය නිර්මාණ සඳහා යොදා ගැනීම.
- නාට්‍ය ධර්ම හා ලෝක ධර්ම අංග නාට්‍යට ගැලපෙන පරිදි නිර්මාණය කිරීම.
- මතුපිටින් රංගනය කෙරෙන සිදුවීමෙන් ගැඹුරු සමාජ යථාර්තයක් නිරූපණය කිරීම.
- විශිෂ්ට රූපණ ශිල්පීන් එතුමාගේ නාට්‍ය නිර්මාණ තුළ රගෑමෙන් තවත් විෂිෂ්ටත්වයට පත්වීම.
- ආවේණික රංග ශෛලියක් භාවිතා කිටීම.
- සමාජය අවදිකරනා, දැනුවත් කරන ආකාරයේ තේමා නාට්‍ය නිර්මාණයන්ට යොදා ගැනීම.

(කරුණු 04 ක් ලියා විස්තර කිරීමට ලකුණු 06ක්)

(07) ලබා දී ඇති සිදුවීම අපූර්ව ලෙස නාට්‍යකම උචිත ලෙස පිටපත් රචනා ශිල්පීය ක්‍රමයෙන් ලියා තිබිය යුතුය. - ප්‍රශ්න පත්‍රයේ සඳහන් නිර්ණායක යටතේ ලකුණු ලබා දෙන්න

(ලකුණු 04x 03 – 12)

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440